
ISSN 1991-040 x

# ගොවිකටයුතු
# පුවත් හසුන

වෙළුම 42 2018 පළමු සහ දෙවැනි කලාප




පිටුව 02




පිටුව 03



පිටුව 06



පිටුව 07





පිටුව 08

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

# ආහාර ආරක්ෂණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීමේ ජාත්‍යන්තර වැඩමුළුව




CIRDAP – APO ජාත්‍යන්තර වැඩමුළුවේ සමාරම්භය

ආසියානු පැසිපික් රටවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානය (Center on Integrated Rural Development for Asia and the Pacific – CIRDAP), ආසියානු ඵලදායිතා සංවිධානය (Asian Productivity Organization - APO) සහ කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සමඟ ඒකාබද්ධව 2018 මාර්තු 05-08 දක්වා දිනයන් හි "ආහාර ආරක්ෂණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීම පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව" හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි.

මෙම ජාත්‍යන්තර සමුළුව සංවිධානය කිරීමේ මූලික අරමුණු වූයේ, වර්තමාන දේශගුණික විපර්යාස හමුවේ ගෝලීය වශයෙන් දැඩි අවධානයට ලක්ව ඇති ආහාර ආරක්ෂණ ප්‍රමිතීන් සම්බන්ධයෙන් වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිෂ්පාදන කළමනාකරුවන්, උපදේශකවරුන්, කුඩා හා මධ්‍ය පරිමාණ ආහාර සැකසුම් කළමනාකරණයට අදාළ විධායකයින් අතර දැනුම, නව ප්‍රවණතා හා අත්දැකීම් හුවමාරු කරගැනීමටත්, ඒ ඔස්සේ ජාත්‍යන්තර වෙළෙඳපොළේ දී ආහාර ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් පැමිණෙන අභියෝගයන්ට මුහුණ දීමේ ක්‍රමෝපායයන් සකස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් ය.

මෙම ජාත්‍යන්තර වැඩමුළුවට අදාළ පිළිගැනීමේ උත්සවය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මහින්ද සිල්වා ශ්‍රවණාගාරයේ දී ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය වසන්ත අලුවිහාරේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් බී. විජයරත්න මැතිතුමා, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ කේ.ඊ.ඩබ්. කරල්ලියද්ද මහතා, ආසියානු පැසිෆික් රටවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ - ටෙවිටා ජී බොසෙයිවගා තගිනවුලාවු, ආසියානු ඵලදායිතා සංවිධානයේ වැඩසටහන් නිලධාරී ආචාර්ය ෂකිත් තන්වීර් හොසේන්, කෘෂිකර්ම රාජ්‍ය ලේකම් ඩී.වී. බන්දුලසේන මහතා, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ජේ.ඒ.ඩී රොෂාන් මහතා සහ අනෙකුත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ ආයතන ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ඉතා උත්කර්ෂවත් ලෙස ආරම්භ විය.

මෙම ජාත්‍යන්තර වැඩමුළුව සඳහා රටවල් 16ක් (ශ්‍රී ලංකාව, තායිලන්තය, ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය, චීනය, කාම්බෝජය, ඉතාලිය, ඉරානය, පෝලන්තය, වියට්නාමය, මොංගෝලියාව, තායිවානය, පිජී, නේපාලය, පිලිපීනය) නියෝජනය කරමින් ආහාර සුරක්ෂණය කිරීමේ විෂයානුබද්ධ විද්වතුන් 26 දෙනෙකු සහභාගී වූ අතර ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආහාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් 14 දෙනෙකු මෙම වැඩසටහනට සහභාගී විය. විදේශීය සම්පත් දායකයින් 06 දෙනෙකු සහ දේශීය සම්පත් දායකයින් 03 දෙනෙකු මෙම වැඩසටහනට සම්පත් දායකත්වය සපයන ලදී.



සම්මන්ත්‍රණයේ අවස්ථාවක්.....

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී සාගරිකා හිටිහාමු මහත්මිය මෙම වැඩ සටහනෙ හි ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරිණිය ලෙස කටයුතු කළාය.

## පර්යේෂණ පුවත්

# 2018 මුල් කාර්තුවේ ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මෙම වසරේ මුල් කාර්තුවේ දී සම්පූර්ණ කොට ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව 04 කි. එම පර්යේෂණ වාර්තාවන් රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තීරණ ගන්නා අංශ වෙත මේ වන විටත් ඉදිරිපත් කොට ඇති අතර උසස් අධ්‍යයන කාර්යයන් හි නියුතු විද්වතුන්ට ද මෙම පර්යේෂණ වාර්තා ලබා දී ඇත. මෙම පර්යේෂණ වාර්තාවන් පිළිබඳ විස්තර පහත සටහන් වේ.

| ප්‍රකාශයට පත් කළ පර්යේෂණ වාර්තා | අදාළ පර්යේෂණ නිලධාරියා හෝ නිලධාරිණිය |
|---|---|
| Evaluation Small Scale Poultry in Sri Lanka (ER – 210) | Sagarika Hitihamu |
| தமிழ் மொழிப்பெயர்ப்பு ஆராய்ச்சி அறிக்கை:- பனை வள தொழில்: வடக்கு கிழக்கு மாகாணங்களில், பங்குதாரர்களின் சமூக-பொருளாதார நிலை மற்றும் பிரச்சினைகள் | R.L.N. Jayatissa, Sri Vijendran and A.M. Nilushini<br>**Translated by**<br>S.J. Francis |
| Vulnerbility of Rainfed Farmers to Drought and Potential Strategies to Enhance Resilience Capacity (ER-211) | H.J.C. Jayasooriya |
| Farmer Perception and Demand for Pesticide in Rice Cultivation of Sri Lanka | T.P. Munaweera and J.A.U.P. Jayasinghe |
| Hybrid Seeds and Vegetable Cultivation in Sri Lanka : Local vs Imported | Prasanna Wijesinghe and Rasika Wijesinghe |
| Prospects and Constraints of Off Season Big Onion Production Programme in Hambantota District | P.A. Jayamini Champika |

## වර්ෂාපෝෂිත ගොවීන්ට නියං තත්ත්වය මඟින් ඇතිවන බලපෑම

දේශගුණික විපර්යාස නිසා කෘෂිකර්ම ක්ෂේත්‍රයට සිදු වන අහිතකර බලපෑම් හේතුවෙන් ආර්ථික සංවර්ධනය සහ තිරසරභාවය පිළිබඳ ගැටලු රැසක් මතු වෙමින් පවතී. මෙම තත්ත්වය තුළ වගාවන්ගේ නිෂ්පාදන ප්‍රමාණය සහ ඵලදායීතාවය අවම වීම ගොවීන් මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුවකි.

මෙවන් වටපිටාවක් තුළ, වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ බෝග වගා කරනු ලබන ගොවීන්ට නියඟය මඟින් සිදුවන බලපෑම සහ එම තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පවතින අවස්ථාවන් පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. ප්‍රධාන වශයෙන් ම වර්ෂා ජලය මත යැපෙමින් වගා කටයුතු සිදු කරන ඉඩම් වැඩි ප්‍රමාණයක් පවතින කුරුණෑගල, පුත්තලම, මොණරාගල, බදුල්ල, කිලිනොච්චිය, සහ මුලතිව් යන දිස්ත්‍රික්ක ආශ්‍රයෙන් අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස් කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම් ව, අදාළ ප්‍රදේශයන් තුළ වර්ෂා ජලය රැස්කර තබා ගත හැකි ව්‍යුහයන් ඉදිකිරීම සහ පවතින ව්‍යුහයන් නඩත්තු කොට ඒවායේ ධාරිතාව ඉහළ නැංවීම යෝග්‍ය බව නිර්දේශ කර ඇත. එමෙන් ම, නියං තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ හැකි නව තාක්ෂණික ක්‍රම සහ බෝග ප්‍රභේදයන් භාවිතය සම්බන්ධයෙන් සහ බහු වාර්ෂික බෝග වගාවන් සඳහා යොමු වීම කෙරෙහි ගොවි ප්‍රජාව දැනුවත් කළ යුතු බවට නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

මෙම අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ, පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරි චින්තක ජයසූරිය මහතා විසින් සිදු කරන ලදී.

# ශ්‍රී ලංකාවේ වී වගාවේ දී පළිබෝධනාශක සඳහා ගොවීන්ගේ ඉල්ලුම සහ ආකල්ප පිළිබඳ අධ්‍යයනය



කෘෂිකර්මාන්තයේ දී පළිබෝධනාශක අවභාවිතා කිරීම හා ඒ හා සම්බන්ධ පාරිසරික හා සෞඛ්‍යමය ගැටලු පිළිබඳව මෙන් ම අනාගත කෘෂිකර්මාන්තයේ තිරසාරබව පිළිබඳව මෑත කාලීනව දැඩි අවධානයක් යොමුවී ඇත. පළිබෝධනාශක භාවිතය නියාමනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සැකසීමේදී පළිබෝධනාශක පිළිබඳව ගොවීන්ගේ ආකල්ප මෙන් ම පළිබෝධනාශක හරහා සිදුවන අහිතකර ප්‍රතිඵල සම්බන්ධ දැනුවත්භාවය වැනි තොරතුරු පිළිබඳව නිසි මූලික අවබෝධයක් පැවතීම අත්‍යවශ්‍ය වේ.

එමනිසා, ශ්‍රී ලංකාවේ වී වගා කරන ගොවීන් හා බැඳුනු ආර්ථිකමය හා ආර්ථිකමය නොවන විවිධ සාධක විශ්ලේෂණය කිරීම මඟින් වී වගා ක්ෂේත්‍රයේ පළිබෝධනාශක භාවිතය සහ ඒ පිළිබඳ ගොවීන්ගේ ආකල්ප පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය සැලසුම් කරන ලදී. පර්යේෂණය සඳහා කුරුණෑගල, අනුරාධපුර, අම්පාර සහ මාතර යන දිස්ත්‍රික්කයන්ගෙන් සසම්භාවී ලෙස තෝරා ගන්නා ලද ගොවීන් 240 දෙනෙකුගේ දත්ත යොදා ගැණුනි.



අධ්‍යයනයට අදාළ සමාජ ආර්ථික විශ්ලේෂණ තුළින් ගම්‍ය වන්නේ වී වගා ගොවීන් පළිබෝධනාශක භාවිතය සම්බන්ධ තීරණ ගැනීම කෙරෙහි සමාජ ආර්ථික සාධක ගණනාවක් බලපාන බවයි. පළිබෝධනාශක භාවිතය සම්බන්ධ ගැටලු බොහොමයක් උද්ගත වීමට හේතු වී ඇත්තේ භාවිතය සම්බන්ධව ගොවීන් තුළ නිසි දැනුවත්භාවයක් නොමැති වීම, ආකල්පමය දුර්වලතාවයන් සහ නොසැලකිලිමත්භාවය වැනි මූලික කරුණු ය. නිවැරදි පළිබෝධනාශක භාවිතය සම්බන්ධව නිසි පුහුණුව සහ දැනුවත් කිරීම සඳහා වන ක්‍රමානුකූල වැඩපිළිවෙලක අවශ්‍යතාවයත් මෙම අධ්‍යයන සොයාගැනීම් තුළින් මතු කරනු ලබයි.

එමෙන් ම, පළිබෝධනාශක නියාමනය හා ඒ සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයේ දී මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත් සමාජ ආර්ථික සාධකයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම තුළින් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි වේ.

මෙම අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරීන් වන ටී.පී මුණවීර සහ ජේ.ඒ.යූ.පී ජයසිංහ විසින් 2016 වර්ෂයේ දී සිදු කරන ලදී.

# දැනට ක්‍රියාත්මක අධ්‍යයන

## කෘෂිකර්ම උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවශෝෂණය වීම

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය අරමුණු කරගෙන කෘෂිකර්මාන්තය පිළිබඳ විශේෂඥ දැනුමෙන් යුතු උපාධිධාරීන් මෙන් ම න්‍යායාත්මක සහ ප්‍රායෝගික අත්දැකීම් බහුල ඩිප්ලෝමාධාරීන් බිහි කිරීම සඳහා දශක ගණනාවක සිට රජය විසින් විශාල අවධානයක් යොමු කොට ඇත.

ඒ අනුව කෘෂිකර්ම උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට කොතරම් දුරට අවශෝෂණය වේද යන්න හඳුනාගැනීම අරමුණු කරගෙන මෙම අධ්‍යයනය සිදුකෙරෙමින් ශ්‍රී ලාංකික ශ්‍රම වෙළෙඳපොළ තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ රැකියා වෙත පිවිසීමේ දී මෙන් ම එකී රැකියාවල නිරතවීමේ දී කෘෂිකර්ම උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් මුහුණ දෙන අභියෝග සහ ගැටලු පිළිබඳව විමසා බැලීම ද පර්යේෂණ අරමුණු අතර වේ. වසර 2012-2015 කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාලයන්ට අයත් කෘෂි විද්‍යා පීඨවලින් බිහි වූ උපාධිධාරීන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් කෘෂිකර්ම විද්‍යාලවලින් පිට වූ විද්‍යාර්ථීන් 607ක් අධ්‍යයන නියැදියට ඇතුළත් කරගන්නා ලදී.

අධ්‍යයන සොයාගැනීම්වලට අනුව අධ්‍යයන නියැදියට අයත් කෘෂිකර්ම උපාධිධාරීන් මෙන් ම ඩිප්ලෝමාධාරීන් බහුතරයක් කෘෂිකාර්මික අංශයට සම්බන්ධ රැකියාවන් හි නිරත වෙමින් දේශීය කෘෂිකාර්මික අංශයේ ප්‍රගමනයට විවිධ අයුරින් දායකත්වය සපයනු ලබයි. එසේ වුව ද, වර්තමානයේ දී රාජ්‍ය අංශය තුළ කෘෂිකාර්මික උපාධිධාරීන් සඳහා පිවිසිය හැකි රැකියා ප්‍රමාණය සීමිත වීම, ඔවුන් කෘෂි ක්ෂේත්‍රයට අවශෝෂණය වීම තීරණය කිරීමට බලපාන ප්‍රධාන කරුණක් බවට පත්ව තිබේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ රැකියාවන් හි නිරතවීම දුෂ්කර වීම සහ එවැනි රැකියා ආකර්ෂණීය නොවීම ද ඔවුන් කෘෂිකාර්මික අංශයට සම්බන්ධ රැකියාවන් ට පිවිසීමට සහ රැඳී සිටීම සඳහා බලපා ඇති ප්‍රධාන බාධාකාරී සාධක ලෙස මෙම අධ්‍යයනය මඟින් හඳුනාගෙන ඇත.

කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීහු බහුතරයක් ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්ති සේවාවට සම්බන්ධ රැකියාවන් හි නිරත ව සිටිති. එසේ වුව ද, කෘෂි ව්‍යාප්ති කටයුතුවල දී විශාල ප්‍රදේශයක් ආවරණය කිරීමට සිදුවීම සහ ක්ෂේත්‍ර රාජකාරී සිදුකිරීමේ දී ඇති ප්‍රවාහන දුෂ්කරතා ඔවුන්ට සිය සේවාවන් වඩා ඵළදායී ව ලබාදීම සඳහා ඇති ප්‍රධාන අභියෝග ලෙස හඳුනා ගැනීමට හැකි වී ඇත.

කෘෂිකාර්මික අංශය හා සම්බන්ධ දැනුම ලබා දීමේ දී රැකියා වෙළෙඳපොළ තුළ ඇති අවශ්‍යතා සළකා බැලීම මෙන් ම කෘෂිකාර්මික නවෝත්පාදන හා නවීන තාක්ෂණය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම තුළින් තරුණ කෘෂිකර්ම උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට අවකාශ ලැබේ. විශේෂයෙන් ම, කෘෂිකර්ම උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් කෘෂි ව්‍යවසායකත්වය සඳහා නැඹුරු කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සැකසීම ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් රටේ කෘෂි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීමට උචිත කාලීන ක්‍රියාමාර්ගයකි.

මෙම අධ්‍යයනයේ සම්බන්ධීකාරක ලෙස මාලතී රම්බොඩගෙදර පර්යේෂණ නිලධාරිණිය කටයුතු කරන අතර සම පර්යේෂක ලෙස ජේ.ඒ.යු.පී. ජයසිංහ මෙනවිය කටයුතු කරන්නී ය.

## ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තෝරාගත් බෝග නිෂ්පාදන පද්ධතීන් දේශගුණික විපර්යාසවලට ගොදුරු වීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය

**දේශගුණික වෙනස් වීම් වල බලපෑම හේතුවෙන් මේ වන විට ලොව පුරා ආහාර නිෂ්පාදන පද්ධතීන් දැඩි අවදානමකට ලක් වී තිබේ. කෘෂිකර්මාන්තය හා ඒ ආශ්‍රිත ජීවනෝපායයන් හි නියුතු ග්‍රාමීය ජනතාව බහුල සර්ම කලාපීය සංවර්ධනය වෙමින් පවතින රටවල් මෙම දේශගුණික විපර්යාසයන්ගේ බලපෑමට ගොදුරු වීමේ වැඩි හැකියාවක් පවතී.**

**දේශගුණික විපර්යාසයන්ට අනුගත වීම සඳහා වඩා ප්‍රතිඵලදායක සැලසුම් සකස් කිරීමේ දී හා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී විවිධ වගා පද්ධතීන් දේශගුණික විපර්යාසයන්ට ගොදුරු වන ආකාරය සලකා බැලීම ඉතා වැදගත් වේ. එබැවින්, ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තෝරාගත් වගා පද්ධතීන් දේශගුණික විපර්යාස වලට දක්වන සංවේදීතාව, නිරාවරණය වීමේ හැකියාව හා එම වෙනස් වීම් සඳහා අනුගත වීමේ හැකියාව නිර්ණය කිරීම සඳහා මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී.**

**වියළි කලාපයේ අනුරාධපුර, මොණරාගල, හම්බන්තොට සහ මාතලේ දිස්ත්‍රික්කයේ වියළි කලාපීය ප්‍රදේශයන් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත් අතර 2017 වසරේ සැප්තැම්බර් මස ආරම්භ කරන ලද ව්‍යාපෘතිය 2019 අප්‍රේල් වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පාරිසරික හා ජලසම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී ජී.ජී.ඩී.එල්.ඩබ්. සමරසිංහ මහත්මිය සම්බන්ධීකරණය කරනු ලබන මෙම ව්‍යාපෘතියේ සම පර්යේෂකයන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා, පර්යේෂණ නිලධාරිණී ටී.පී. මුණවීර මහත්මිය, පර්යේෂණ නිලධාරිණී ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර මහත්මිය, පර්යේෂණ නිලධාරි එච්.ජේ.සී. ජයසූරිය මහතා සහ පර්යේෂණ නිලධාරිණී එන්.එම්. ඩයස් මහත්මිය යන අය කටයුතු කරති.**

## වාර්තා වැඩසටහන



**අතිරේක අධ්‍යක්ෂ ආර්.එල්.එන්. ජයතිස්ස මහතාගේ අතිරේක ආහාර බෝග වගාවේ හඳුනාගත් ගැටලු සහ ඒවාට විසඳුම් නැමැති පර්යේෂණ අධ්‍යයනය ඇසුරින් 2017 නොවැම්බර් මස 26 සිට 29 වන දින දක්වා යාපනය ප්‍රදේශයේ සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව ඇසුරෙන් සකස් කළ වාර්තා වැඩසටහන 2018 මැයි මස 10 දින කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත අලුවිහාරේ මැතිතුමා හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ කේ.ඩබ්.ඊ. කරල්ලියද්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහින්ද සිල්වා ශ්‍රවනාගාර පරිශ්‍රය තුළ දී එළි දැක්විණි. යාපනයේ තෝරාගත් ප්‍රදේශයන් ඇසුරින් සිදු කළ මෙම වාර්තා වැඩසටහන යාපනය කෘෂිකර්මාන්තය හා ගොවි කාන්තා ව්‍යවසායකත්වය නමින් නම් කර ඇති අතර මෙම වාර්තා වැඩසටහනෙහි නිෂ්පාදන දායකත්වය ප්‍රකාශන අංශය දරනු ලැබීය.**



## සහෝදරත්වයේ බක්මහ උළෙල

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබසාධක සංගමය විසින් වාර්ෂිකව පවත්වනු ලබන බක්මහ උළෙල මෙවර ද ඉතා උත්කර්ෂවත් අන්දමින් අප්‍රේල් මස 26 දින හිටපු අධ්‍යක්ෂ සහ සුබ සාධක සංගමයේ අනුශාසක කේ.ඩබ්.ඊ. කරල්ලියද්ද මහතාගේ ප්‍රධානත්වයෙන් ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි.



කඹ ඇදීම



අවුරුදු උත්සවයේ ත්‍යාග ප්‍රදානය

සේවක සහයෝගීතාවය වර්ධනය කිරීම ප්‍රධාන අරමුණු කරගත් බක්මහ උළෙල ජන ක්‍රීඩා රැසකින් සමන්විත විය. දේශීය විදේශීය අමුත්තන් රැසකගෙන් මෙම උත්කර්ෂවත් උළෙල විචිත්‍රවත් විය.

## වෙසක් උත්සවය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබසාධක සංගමය විසින් වෙසක් පොහොය නිමිති කරගෙන වාර්ෂිකව පවත්වනු ලබන ධර්මදේශනය, දන්සැල සහ වෙසක් කූඩු තරඟය මෙවර ද ආයතන පරිශ්‍රයේ දී සංවිධානය කෙරුණි. ඒ මෙවර 2018 අප්‍රේල් මස 29 වන දිනට යෙදී තිබුණු වෙසක් පොහොය නිමිති කොටගෙන ය.




දන්සැලට පෙර සූදානම



දන්සැලට සපැමිණි පිරිසට සංග්‍රහ

# වැඩමුළු







## කෘෂි ව්‍යාපාර සංකල්ප සහ අලෙවිකරණ ව්‍යාප්තියේ භාවිතය පිළිබඳ තෙදින වැඩමුළුව

ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සැපයුම්දාම සහ අලෙවි අංශය ආශ්‍රිතව කෘෂි ව්‍යාපාර සංකල්ප කෙසේ භාවිතා වන්නේ ද යන්න පිළිබඳ කෘෂිකර්ම උපාධි අපේක්ෂකයින් හට දැනුම හා අත්දැකීම් ලබා දීම අරමුණු කර ගත් "කෘෂි ව්‍යාපාර සංකල්ප සහ අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ තෙදින වැඩමුළුව" 2017 දෙසැම්බර් 08 සිට 10 වැනි දින දක්වා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නාරායනසාමි සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. මෙම වැඩමුළුව මඟින් යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ කෘෂි ව්‍යාපාර සහ ව්‍යාපාර ගිණුම්කරණය හදාරන උපාධි අපේක්ෂකයින් ඉලක්කගත කණ්ඩායම් ලෙස තෝරා ගෙන තිබුණි. වැඩමුළුවේ සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිතයා ලෙස කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත අලුවිහාරේ මැතිතුමා සහභාගී විය. මෙම වැඩමුළුව වඩාත් ඵලදායී කර ගැනීම සඳහා සංකල්ප හා මූලික න්‍යායාත්මක දැනුම ලබා දීම සඳහා පැවැත් වූ දේශන වලට අමතරව ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් ම සංවිධානය කොට තිබුණි.

### ප්‍රකාශිත වාර ප්‍රකාශන - 2018







සියළු විමසීම්
ගොවිකටයුතු පුවත් හසුන
අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක 114, විජේරාම මාවත,
කොළඹ 07


**උපදේශකත්වය**
කරුණාදාස උඩගේ
ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ

**අධීක්ෂණය**
එස්.ඒ.සී.යූ. සේනානායක
ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

**සම්පාදනය**
ඉන්දිවරී දිසානායක
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී (සිංහල)

**නිර්මාණකරණය**
උදේනි කරුණාරත්න
පරිගනක අකුරු සැකසුම්කරු